# ඩාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

41 වන කාණ්ඩය | 05 වන කලාපය | 2025 ජූලි කලාපය


# ඇමරිකානු වෙළඳ යුද්ධයේ ලංකාව කම්කරු කාන්තාවන් බිලි දෙයිද?




2025 ජූලි 17 වන දින කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත මහතා ඇඟළුම් ඇතුළු නිෂ්පාදන 1,161 ක් සඳහා 0%ක බදු පැනවීමට රජය එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් සිටින බව ප්‍රකාශ කළේය. මෙවසර අප්‍රේල් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද 40% ක තීරුබදු හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ඇඟළුම් ඇමරිකාව තුළ මිල අධික වීම හරහා ජාත්‍යන්තර ඇඟළුම් සන්නාම සහ ඇඟළුම් නිෂ්පාදන සමාගම් සඳහා ඇණවුම් සහ ආදායම අඩු කිරීමේ ප්‍රවණතාවය ඇත.

මෙම තීරුබදු පැනවීම ජනාධිපති ට්‍රම්ප් ආරම්භ කළ වෙළඳ යුද්ධයක හමුවකි. තීරුබදු ක්‍රියාත්මක කිරීමට පෙර දින 90 ක විරාමයක් ඇති කිරීමට අප්‍රේල් මාසයේදී තීරණය කරන ලදී. මෙය ජූලි 9 වන දින කල් ඉකුත් විය. තීරුබදු සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ඇතැයි දැන් යම් බලාපොරොත්තුවක් ඇති අතර එමගින් ශ්‍රී ලාංකික කම්කරුවන් ඔවුන්ගේ කම්කරු අයිතිවාසිකම් කප්පාදු කිරීමේ බරින් මුදා ගැනීමටයි කම්කරුවාගේත් අපගේත් බලාපොරොත්තුව.

2 වන පිටුවට...

## ඇතුළු පිටු


03 පිටුව - ආදරය දරාගත් ජීවිතය
04 පිටුව - ඇමරිකානු වෙළඳ යුද්ධයේ ලංකාව කම්කරු කාන්තාවන් බිලි දෙයිද?
05-06 පිටු - අපේ වැඩ
07-08 පිටු - ජාතික හා ජාත්‍යන්තර වැඩ
09 පිටුව - අපේ අයිතිවාසිකම්
10 පිටුව - සිතුවිල්ල/ප්‍රහේලිකාව
11 පිටුව - කවි පිටුව/විදෙස් පුවත්

ඩාබිඳු සාමූහිකය
221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective

# නොකියාම වැසෙන ආයතන සමඟ අර්බුදයේ ගැටෙන සේවකයින්

පසුගියදා කිසිදු දැනුම් දීමකින් තොරව වසා දැමූ NEXT ආයතනය නැවත වතාවක් කම්කරුවන්ට ඔවුන්ගේ රැකියා සුරක්ෂිත භාවය පිළිබඳ අවදානම් මතු කළා. ප්‍රධාන පෙලේ ආයතනයක් ගත් මේ අනීතික ක්‍රියාවලිය වෘත්තීය සමිති කෙරෙහි මතු කළේ ව්‍යාකූල තත්වයකි. රටක ආයෝජනයක් කර මෙසේ ඉවත් විය හැකිද? ආයෝජන දිරි ගැන්වීම් නිසා මතුවන මෙවැනි ලිහිසි තත්වයන් නිසාම කම්කරුවන්ට තව තවත් වෘත්තීය අවදානම් පිළිබඳ සැලකිල්ලට ගැනීමට සිදු වෙනවා. හාම්පුතා නිරන්තරයෙන් නීතියේ රැහැනින් පලායාමට අවස්ථාව උදා කර ගැනීම නිසා ඒවයේ ගොදුරු බවට පත්වන්නේ කම්කරුවන් ය. දීර්ඝ වැඩ පැය කරමින්, පවුල් ජීවිත හා සමාජ ජීවිත කැප කරමින් ලබා දෙන්නා වූ සේවයට ගරු කිරීමක් ලබා දෙන්නට හාම්පුතා කටයුතු කරන්නේ නැත. ට්‍රිලියන් ගණනින් ලාභ ඉපැයීමට සහය දුන් කම්කරුවාගේ අනාගතය කෙරෙහි ඔවුනට කිසිදු වටිනාකමක් නැත. ආයතනයෙන් දෙන ඕනෑම කෑම වේලක් ලැබ කරනා සුවච කීකරු සේවය ඔවුන්ට වටින්නේ නැත. නිෂ්පාදන අධික කාලයට අතිකාල ලබමින් සේවය කිරීමටත්, රාත්‍රී සේවය සමග ප්‍රසාද දීමනා ලැබුමටත් එසේ නොමැති කාල වලදී මූලික වැටුපෙන් පමණක් ජීවිතය ගැටගසා ගැනීමට සිදු වීමත් නිසා ඔවුන් ණය පොලී, බදු වල ගොදුරු වී ඇත.

හාම්පුතාට ඉදිරි ගමනක් ඇතුවා සේම කම්කරුවටද පිරවිය යුතු කොටස් ඇත. ඍජු හා වක්‍ර ලෙස ඔවුන්ගෙන් යැපෙන කොටස් ඇත. ඒවා පසුපස ආර්ථික අර්බුද, නීති ප්‍රතිසංස්කරණ, ඇමරිකානු බදු ප්‍රශ්නය ද අවදානම් තව තවත් තීව්‍ර කරයි. සිය නිෂ්පාදන නිසා ලාභ ලබන හාම්පුතත්, සිය ඡන්දය නිසා බලය තහවුරු කර ගන්නා පාලකයාත් කම්කරුවා දෙස බලන්නේ සංවර්ධනයේ පුරුක් ලෙස පමණි. ඊට අදාල පහසුකම් සැපයීමට, සේවා හා කොන්දේසි වල ප්‍රතිලාභීන් බවට පත් කිරීමේ වගකීමෙන් හැමවිටම නිදහස් වීමට උත්සහ දරයි. ජාත්‍යන්තර සම්මුතීන් මගින් පෙන්වා දෙන අයිතිවාසිකම් තවදුරටත් පාලකයාට කර්මාන්තශාලා වැසෙන ක්‍රියාදාමයක් ලෙස සලකයි. හොඳින් හෝ නරකින් සේවාව ලබාගැනීම පමණක් ඔවුන්ගේ කාර්ය භාරය සේ සළකයි. ත්‍රෛපාර්ෂවීය බවක් ඔවුන්ගේ පෙනෙන්නේ නැත. කම්කරු බලය, වෘත්තීය සමිති බලයට එහා ගිය බලයත් හාම්පුතා විසින් භාවිතා කිරීම කම්කරු අයිතිවාසිකම් තව දුරටත් වලපල්ලට ඇද දැමීමට කරන උත්සහයකි. එම උත්සහය පරාජය කිරීමට කම්කරුවන්ගේ පාර්ශවය නියෝජනය කරනා සියලු දෙනාගේම වගකීම කර ගනිමු.

1 පිටුවෙන්...

## ඇමරිකානු වෙළඳ යුද්ධයේ

තීරුබදු කම්කරුවන්ට බලපාන්නේ කෙසේද සහ එය ඔබට අදාළ වන්නේ ඇයි? දකුණු ආසියාවේ ඇඟළුම් කර්මාන්තවල අත්දැකීම් සැලකිල්ලට ගෙන, ලාභ පවත්වා ගැනීමට සන්නාමකරුවන් මෙම තීරුබදු බර ලංකාවේ ඇඟළුම් සමාගම් මත පැටවිය හැකි අතර, එමගින් පිරිවැය අඩු කිරීමේ පියවර අවුළුවනු ඇත. තීරුබදු දින 90ක විරාමය තුළ, ඇඟළුම් නිෂ්පාදන සමාගම් තම ව්‍යාපාරවලට තීරුබදු වල බලපෑමට මුහුණ දීම සඳහා අවම කිරීමේ උපාය මාර්ග අනුගමනය කරමින් පවතී. මෙම උපාය මාර්ග බොහොමයක් ඔවුන්ගේ ශ්‍රම බලකාය කෙරෙහි අවධානය යොමු කරන ලදී.

අප්‍රේල් මස පටන් බොහෝ සේවකයින් අතිකාල වැඩ අඩු කිරීමක් එමගින් ඔවුන්ගේ ආදායම අඩු වීමක් වාර්තා කර ඇත. කටුනායක සහ බියගම සේවකයෝ බොහෝ දෙනෙක් වාර්තා කළ පරිදි අඩු වූ වැටුප් උපයා ගැනීම සඳහා මෑන්පවර් වැඩ කරති. උතුරේ කම්කරුවන්ට, කලාප වල අවස්ථාවන් අඩු නිසාවෙන් ගොවිතැනේ හෝ කුඩා ව්‍යාපාර සහ සාප්පු වල අවිධිමත් රැකියා වල නිරත වීමක් අප්‍රේල් මාසයේ දී දකින්නට ලැබුනේය. මෙයින් පිළිඹිබු වෙන්නේ රැකියා අස්ථාවරත්වය මධ්‍යයේ විරැකියාවයි.

කර්මාන්තශාලා හැකිලීමේ උත්සාහයන් දැනටමත් ආරම්භ වී ඇත. මහා පරිමාණ කර්මාන්තශාලා නිෂ්පාදන ලයින් සංඛ්‍යාව අඩු කරමින්, එක් එක් ලයින් සඳහා සේවක සංඛ්‍යාව වැඩි කරමින් සහ ඉලක්ක දෙගුණ කරමින් සිටින බව කටුනායක සේවකයින් සඳහන් කළහ. කම්කරුවන්ට දරාගත නොහැකි ඉලක්ක අත්විඳිය නොහැක; නවක සේවකයින්ට එම ඉලක්ක  නිෂ්පාදනය කිරීමට අපහසු වන අතර බොහෝ දෙනෙක් තම රැකියාවලින් ඉවත් වී හෝ වැඩිපුර නිවාඩු ලබා ගනිමින් සිටිති. මෙලස අස්වෙන සේවකයින්ගේ පුරප්පාඩු පිරවීමෙන් තොරව කර්මාන්තශාලා මෙය ප්‍රයෝජනයට ගනිමින් සිටී.

සේවකයින් සේවයෙන් පහ කිරීමේ බියෙන් පෙළෙන මානසිකත්ව පීඩනයකින් සිටිති. ඔවුන්ගේ වැඩ, ඉලක්ක සහ අත්වැරදීම් සූක්ෂම කාචයක යටතේ නිරීක්ෂණයට භාජනය වී ඇත. බොහෝ සේවකයින් කියා සිටියේ සුළු හානියකට පවා අවවාද ලිපි ලැබී ඇති බවත්, ලිපි තුනකට පසු එම සේවකයින් පිළිබඳව විමසීම් පවත්වන බවත්ය. සේවයෙන් පහ කිරීමට පදනමක් සැකසීම සඳහා සුපරීක්ෂකවරුන් සහ කළමනාකරුවන් සුළු වැරදි සොයා බලමින් සිටින නිසාවෙන්, කම්කරුවන් සේවයෙන් පහ කළ හැකි බවට සේවකයින් අතර බියක් ඇති වී ඇත.

4 වන පිටුවට...



# ආදරය දරාගත් ජීවිතය

ගැහැණියකගේ ජීවිතය කියන්නේ විවිධ හැඟීම්වලින්, වගකීම්වලින්, ඉවසීමෙන් සහ නිහතමානී ජයග්‍රහණ වලින් යුතු අති විශිෂ්ට චරිත ජාලාවක්. දන්නව ද ගැහැණු හිත් හරි ධෛර්යවන්තයි. ඒ සියල්ලේ මූලික අරටුව ලෙස ගැහැණු හිත් හෙව්වේම ආදරය යි. මේ ආදරය විවාහය දක්වා යන ආදරය පමණක් නොවෙයි. සැබැවින්ම ගැහැණිය, ඇයට ලබාදෙන ආදරය රකිමින්, ඒ ආදරය අන් අය සමඟ බෙදා ගන්නා, ඇතැම් අවස්ථා වල ආදරය වෙනුවෙන් තමා පවා අමතක කරන ගැහැණිය හා ආදරය අතර ඇත්තේ හරි අපූරු බැඳීමක්.

### 1.ගැහැණියකගේ ජීවිතයේ පදනම - ආදරය

කුඩා අවධියේ දී තම මව පියා යටතේ ආදරය රැකවරණය ලබන ඇය කෙමෙන් කමෙන් ආදරය ලබන්නට විවිධ චරිත නිරූපණය කරනු ලබයි. විටෙක සොහොයුරියක් ලෙස ද තවත් විටෙක බිරිඳක් මවක් යෙහෙළියක් පෙම්වතියක් ලෙස විවිධ වූ චරිත නිරූපනය කරනු ලබයි. ගැහැණු පිරිමි භේදයකින් තොරව මිනිසා ආදරය කරන්නට ලැබෙන ආදරයට ගරුත්වය දෙන්නට ඉගන ගන්නේ මවකගේ කළලයෙ හි පිළිසිඳ ගත් දා පටන්ය. එතැන් පටන් දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය තුළ දී හමුවන විවිධ හමුවීම් තුළින් ආදරය සොයයි. ආදරය ගෞරවය ඉගනගනියි. ගැහැණු දරුවෙකුගේ ප්‍රථම ආදරවන්තයා වන්නේ ඇයගේ පියා යි. මනෝ විද්‍යාත්මකව බැලූ කල දැරිය සිය පියා මවට දෙන ආදරය රැකවරණය පරයා යන ආදරයක් රැකවරණයක් සිය පියාගෙන් බලාපොරොත්තු වෙයි. එතැන් පටන් ආදරය වෙනුවෙන් ඇය තරඟ කරයි. නමුත් ජීවිතයේ හමුවන ආදර කතාන්දර කවි වගේ සරල නැහැ. එය සංකීර්ණයි, අභියෝග සහ කැපවීම් වලින් පිරුණු, නමුත් ගැහැණිය ආදරය තුළ රඳවයි - හදවත බිඳුණා වුනත්, ඇය නැවත ගොඩනැඟෙයි, සුව වෙයි, ආදරය කිරීමට තවමත් බලාපොරොත්තුවෙන් පිරී සිටී.

### 2. නොපෙනෙන ආදරය - නිහතමානී සේවය

සිය පවුලේ ශක්තිය වන්නේ ඇය යි. පවුලේ අයවලුන් පෝෂණය කරමින් ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරමින් මානසික මෙන්ම ඇතැම්විට කායික රෝග සුවපත් කිරීමට ද ඇයට හැකියාව ඇත. ඒ අනුව ගැහැණිය නිහතමානී ආදර රූපයන් නිරූපනය කරයි.

### 3. ආදරය සහ වේදනාව

ආදරය සතුට ගෙනෙනවා. නමුත් සමහර විට ඒක වේදනාවක්. බොහෝ ගැහැණියන්ට ආදරය තුළින් විප්පයෝග, විශ්වාස භංග, මනෝ වංචනාවන්, හෝ විෂ වගී සබඳතා වලට මුහුණ දෙයි. සමාජය කියන්නේ "හැරෙන්න එපා, පවුල වෙනුවෙන් ඉවසන්න." නමුත් අද ගැහැණියන් මේ සංකේතය බිඳ දැමීම ආරම්භ කරලා.

### 4. ස්වයං ආදරය - ගැහැණියකගේ නව විප්ලවය

අද ගැහැණියන් තමාටම ආදරය කරන තමාටම වටිනාකමක් දෙන්නට පටන් ආරම්භ කරලා. ස්වයං ආදරය කියන්නේ "මම පමණයි" කියන වචනයක් නොවෙයි. එය "මමත් වැදගත්" කියන දැනුමයි.

### 5. බිඳන නෙවෙයි, ගොඩනඟන ආදරය

අද යුගයේ ගැහැණියට අවංකත්වයෙන් සහ ගෞරවයෙන් පිරුණු ආදරය අවශ්‍යයි, එය සැබැවින් බිඳීමක් නොව ගොඩනැගීමක්.

### අවසන් සිතුවිල්ල

ගැහැණියකගේ ජීවිතය ආදරයෙන් හැඩ වෙයි. ලබාදෙන, ලබන, අහිමිවෙන, නැවත හමුවෙන ආදරය. නමුත් වඩාත් වැදගත් ආදර කතාවක් ඇරඹෙන්නේ, ඇය තමාටම ආදරය කරන්න ආරම්භ කරන විටයි. සැබැවින්ම ගැහැණිය සමාජයේ තියුණු අසිපතක් ගැහැණුන් කියන්නේම රළ මෙන් ආදරය සොයනා මහ සයුරක්!

කවිශා වන්නිනායක

## 2 පිටුවෙන්... ඇමරිකානු වෙළඳ යුද්ධයේ




වෙනත් ඕනෑම විදේශ සම්බන්ධතාවයක් මෙන් විදෙස් වෙළඳාම ද කේවල් කිරීමකි. එය ලැබීමක් සහ ගැනීමකි. ඇමරිකාව සහ ගෝලීය දකුණු රටවල් අතර බල අසමතුලිතතාවය නිසා ට්‍රම්ප්ගේ වැනි වෙළඳ ප්‍රතිපත්ති වෙළඳ යුද්ධයක් ලෙස සැලකේ. හේතුව, අවසානයේ ලංකාව වැනි රටවල කම්කරුවන්ට, ගොවීන්ට සහ කුඩා ව්‍යාපාරවලට හානියක් වන නිසාවෙන්. එනම් ආර්ථික සංකෝචනය හරහා විරැකියා අවදානමක් ඇති කරයි. දැනටමත් IMF කප්පාදු පියවර යටතේ තීව්‍ර කරන ආර්ථික හා ණය අර්බුද සමඟ පොරබදමින් සිටින ශ්‍රී ලංකාව සහ පකිස්ථානය වැනි රටවල තත්වය තවත් නරක අතට හැරේ. විශාල ව්‍යාපාර රඳවා ගැනීමටත් තවත් විදේශීය ව්‍යාපාර රටට ආකර්ෂණය කිරීමටත් රජය කුමක් කරයිද? ලංකාවට ප්‍රමාණවත් ඩොලර් ලබා ගැනීම සහතික කිරීම සඳහා ඔවුන් කම්කරුවන් බිලි දෙයිද?

පසුගිය වසර 20 තුළ ඇති වූ බහුවිධ අර්බුධයේ, බර දරා ඇත්තේ කම්කරුවන්ය. 2008 මූල්‍ය අර්බුදයෙන් පසු, සේවායෝජක සංගම් දෛනික වැඩ කරන පැය ගණනේ වෙනස්කම් ඉල්ලා සිටියේය. 2013 දී, පැය 9ක වැඩ දිනයක් හෝ දින 5 ක වැඩ සතියක් සඳහා අනුමත කර නීතිය මඟ හැරීමට රජය එකඟ විය. 2025 වන විට, මෙම පැය 9 වැඩ දිනය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්තශාලා 400 ක් ඇත. COVID -19 වසංගතය දී කම්කරුවන්ට රැකියා අහිමි විය. මෑන්පවර් සේවකයින් විරැකියාවේ. රඳවා ගත් සේවකයින්ට අහිතකර සෞඛ්‍ය තත්වයන් යටතේ ඉලක්ක දෙගුණ කර අර්ධ වැටුප් ගෙවන ලදි. බොහෝ දෙනෙකුට කෝවිඩ් ආසාදිතයින් වූහ. 2022 ආර්ථික අර්බුදයේ දී, කර්මාන්තශාලා තාවකාලිකව සේවය අත්හිටුවීම සහ වසා දැමීම් හේතුවෙන් සේවකයින්ට අදායම් අහිමි විය. මෙම අර්බුදවලට හාම්පුතුන්ගේ බලපෑම යටතේ රජයේ ප්‍රතිචාරය වී ඇත්තේ නම්‍යශීලී වැඩ සඳහා ඉඩ සලසන කම්කරු නීති ප්‍රතිසංස්කරණයි - මේ හරහා සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාවේ වගකීමත් සමාජ ආරක්ෂණ විධික්‍රම කප්පාදු කිරීම සහ සේවා යෝජකයින්ට අහේතුකව කැමැත්තෙන් බඳවා ගැනීමට සහ පහ කිරීමටත් බලය ලබා දෙයි. අර්බුදයක් ඇති වූ සෑම අවස්ථාවකම, රජය සහ IMF, ලෝක වාණිජ සංවිධානය සහ ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර ආයතන ගෞරවාන්විත ශ්‍රමය සහ කම්කරු අයිතිවාසිකම් බිල්ලට දීමට යොමු වී ඇත.

කම්කරු නීති ප්‍රතිසංස්කරණ විදෙස් ආයෝජකයින් ආකර්ෂණය කර ගනු ඇතැයි පැවසීම මිථ්‍යාවකි. බොහෝ අධ්‍යයනවලින් පෙන්වා දී ඇත්තේ කම්කරු ආරක්ෂණ දුර්වල කිරීම තිරසාර විදේශ ආයෝජන හෝ ආර්ථික වර්ධනයකට හේතු නොවන බවයි. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ පර්යේෂණවලින් පෙනී යන්නේ ශක්තිමත් කම්කරු අයිතිවාසිකම් ඇති රටවල් බොහෝ විට දිගු කාලීන, ස්ථාවර විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමේදී, විශේෂයෙන් ඉහළ අගය එකතු කළ කර්මාන්තවල වඩාත් සාර්ථක වන බවයි. දේශපාලනික සහ ශ්‍රම ස්ථාවරත්වය, පුහුණු ශ්‍රම බලකායන් සහ ස්ථාවර නියාමන වපසරියක් විදෙස් ආයෝජකයින් අගය කරයි - ඒ කිසිවක් කම්කරු නීති නියාමනය ඉවත් කිරීමෙන් ශක්තිමත් නොවේ.

ඇඟළුම් තීරුබදු ඉවත් කිරීමට රටවල් දෙකෙහි රජයන් සාකච්ඡා කරමින් පවතී. නමුත් 0% තීරුබදුවක් ලබා ගැනීම සඳහා ලංකාව බිලි දී ඇත්තේ කුමක්ද? 40% සිට 0% දක්වා අඩු කිරීමක් ඇමරිකාව ඉදිරිපත් කළේ මන්ද? කම්කරු අමාත්‍යවරයා ප්‍රකාශ කළේ වෙළඳ හෙළිදරව් නොකර රාජතන්ත්‍රිකභාවය ආරක්ෂා කිරීමට ඔවුන් වගවෙන බවයි. මෙම වෙළඳ කම්පනයට ප්‍රතිචාර දැක්වීමේදී, රජය කම්කරුවන් ආරක්ෂා කළ යුතුය. ඔවුන්ගේ රැකියා, වැටුප් සහ අයිතිවාසිකම් කප්පදු නොකළ යුතුය. මෙම තීරුබදු සඳහා කම්කරුවන් විපාක ගෙවිය යුතු නොවේ.

# සහෝදරත්වයේ කවය



ශ්‍රී ලංකාවේ ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තා සේවිකාවන්ගේ ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍යය අයිතිවාසිකම් සහ අභිමානය වෙනුවෙන් උද්දේෂණය කිරීම පිළිබඳ අපගේ ව්‍යාපෘතිය යටතේ කිලිනොච්චි, වවුනියා, බියගම සහ කටුනායක යන ප්‍රදේශයන්හි දී සහෝදරත්ව කවයන් පවත්වන ලදී. ඇඟළුම් කර්මාන්තශාලා ආශ්‍රිතව අප විසින් ගොඩනගන ලද නායකත්වය හරහා සහෝදරත්වයේ කව 15 ක් මෙම ප්‍රදේශයන් හතරේදී පවත්වන ලදී. මෙහිදී සහභාගී වූ කාන්තාවන් සමඟ ඔසප් කැලැන්ඩරය, උපත් පාලන ක්‍රම, කන්‍යා පටලය හා කන්‍යාභාවය අතර වෙනස, ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය හා ඔසප් දරිද්‍රතාවය සහ කළමනාකරණය පිළිබඳව  සාකච්ඡා කරන ලදී. මෙම වැඩසටහන් තුළින් ලබා ගන්නා දැනුම ඔවුන්ගේ ප්‍රයෝගික ජීවිතයේදී උපයෝගී කරගත් අවස්ථා අප සමඟ බෙදා ගැනීම වැඩසටහනේ ඵලදායීතාවය ඔප්නංවා දක්වයි.




# සහෝදරත්ව කව අවසන් නායකත්ව පුහුණු සැසිය




2025.06.29 වැනි දින කටුනායක හා බියගම ප්‍රදේශ වල ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තා නායකයන් සඳහා පවත්වනු ලැබූ අවසාන ගැඹුරු පුහුණු සාකච්ඡාව මෙවරත් Good Wood Plaza හොටෙල් පරිශ්‍රයේ දී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තයේ කාන්තා සේවිකාවන්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය අයිතීන් සහ ගෞරවය වෙනුවෙන් පෙනී සිටීමේ ව්‍යාපෘතිය යටතේ සහෝදරත්ව කව පැවැත්වීම සඳහා කාන්තා නායකයින් පුහුණු කිරීමේ වැඩමුළු 05 ක් පැවැත්වීමට තිබූ අතර මෙය අවසන් පුහුණු වැඩමුළුව විය.

මෙම වැඩමුළුවද සුපුරුදු පරිදි පබා දේශප්‍රිය මහත්මිය විසින් පවත්වනු ලැබූ අතර මෙහි දී මුලින් ලබාගත් ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය කරුණු පිළිබඳව ගැඹුරින් නැවතත් සාකච්ඡා කර සහෝදරත්ව කව සිදු කිරීමේ දී ඇති වූ ගැටළු වලටද පිළිතුරු ලබා දෙන ලදී. මෙම නායකයින් නේවාසිකාගාරවල ජීවත් වන සේවකයින් හා එක්ව අපගේ ශරීර සහ සෞඛ්‍ය ගැන කතා කිරීමට ප්‍රජාවක් නිර්මාණය කර ඇත.

# සිවිල් සමාජ සංවිධාන පුහුණු වැඩමුළුව



ඩාබිඳු සාමූහිකය විසින් සංවිධානය කරනු ලබන Advocacy Master Class පුහුණු වැඩසටහන් මාලාවේ 03 වන සහ 04 වන වැඩසටහන් ඇඟළුම්, ධීවර, වතු, LGBTQI+ ප්‍රජාව වැනි විවිධ ක්ෂේත්‍ර වල නිරත කම්කරු කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටින තවත් සිවිල් සංවිධාන 09 ක සහභාගීත්වයෙන් 2025 ජූනි මස 19 හා 20 යන දෙදින පුරා සහ ජූලි මස 23, 24 හා 25 යන තෙදින පැවැත්විණි.


Grass Rooted Trust සංවිධානයේ පබා දේශප්‍රිය මහත්මිය සහ සත්‍යානි මහත්මිය විසින් මෙහෙයවනු ලැබූ මෙම වැඩමුළුවල දී කලින් පැවැත්වූ වැඩසටහන් වලදී ලබාගත් ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳව දැනුම උපයෝගී කර ගනිමින් ප්‍රායෝගික සිදුවීම් උදාහරණ ලෙස ගෙන ගැඹුරු සාකච්ඡා වට හා විසඳුම් සෙවීමට පුහුණු වීම මෙන්මල මේ හා සම්බන්ධව දැනට ලෝකයේ පවතින නිර්දේශ අධ්‍යනය කිරීම වැනි ක්‍රියාකාරකම් බොහෝමයක් සිදුකරන ලදි. ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳව ඇති ගැටළු හා ඒවාට ජාලගතව විසඳුම් සෙවීමේ අරමුණින් ඩාබිඳු සාමූහිකය විසින් තබන තවත් එක් පියවරක් ලෙසින් මෙය හොවා දැක්විය හැකිය.

# ජංගම වෛද්‍ය සායන



ජූනි 15,20 සහ 27 වැනි දිනයන්හි ඩාබිඳු සාමූහිකය බියගම, කිලිනොච්චි, සහ කටුනායක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සමඟ එක්ව ඇඟළුම් සේවිකාවන් සඳහා ජංගම සායන සංවිධානය කළේය. රුධිරගත සීනි ප්‍රමාණය සහ රුධිර පීඩන මට්ටම් පරීක්ෂාව, පියයුරු සහ පැප් පරීක්ෂාව එහි දී සිදු විය. කම්කරු කාන්තාවන්ගේ ශරීර ස්කන්ධ දර්ශකය, ප්‍රජනක සෞඛ්‍ය, උපත් පාලන ක්‍රම, ලිංගික සහ සමාජභාවය මත පදනම් ප්‍රචණ්ඩත්වය ගැන කතා කිරීමට ද අපි ආරක්ෂිත අවකාශයක් සකස් කළෙමු.

මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වෛද්‍යවරු බෝ නොවන රෝග සහ කාන්තාවන්ගේ සෞඛ්‍යයට බලපාන රෝග, විශේෂයෙන් පියයුරු සහ ගැබ්ගෙල පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් ද පැවැත් වූහ. බොහෝ විට සමාජයේ නොසලකා හරින ඇඟළුම් සේවකයින් සමඟ මහජන සෞඛ්‍ය සේවා පද්ධතිය හා සම්බන්ධ කිරීමට මෙම අවස්ථාවන් ප්‍රයෝජනවත් විය. මෙම සායන ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තා සේවිකාවන්ගේ ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය අයිතිවාසිකම් සහ අභිමානය වෙනුවෙන් සිදුකළ ඩාබිඳු අපගේ ව්‍යාපෘතියේ කොටසකි.



# අයිතිවාසිකම් රහිත ණය ගිවිසුම් අනාගතයක් නොවේ: එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කියයි



Photo credits: Sophia Lindell / United Nations

2025 ජූනි 24 වන දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් වොල්කර් ටර්ක් ශ්‍රී ලංකාවට පැමිණ IMF සහ ලෝක බැංකුව ඇතුළු ජාත්‍යන්තර මූල්‍ය ආයතන ගෝලීය වශයෙන් ප්‍රතිසංස්කරණය කරන මෙන් අවධාරණය කළේය. ඔහු අවධාරණය කළේ, ශ්‍රී ලංකාව වැනි රටවල ණය බර මානව හිමිකම්වලට හානි කරන බවයි. ධාබිඳු සාමූහිකයේ වසර 40ක අරගලය ප්‍රතිරාවය කරමින්, අර්බුදය මධ්‍යයේ අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, සමාජ ආරක්ෂණය සහ ගෞරවාන්විත රැකියාවන් සඳහා ආයෝජනයන් වැනි මානව හිමිකම් කේන්ද්‍ර කර ගත් ආර්ථික ප්‍රතිපත්තිය සැලැසුම් ලෙස ඔහු රජයන්ගෙන් ඉල්ලා සිටියේය.

# කාන්තාව හා මාධ්‍ය සාමූහිකයේ 40 වන සංවත්සරය
## "ආර්ථික අර්බුදය මධ්‍යයේ කාන්තා සේවිකාවන් අවදානමේ"



ජූනි 16 වන දින, කාන්තා සහ මාධ්‍ය සාමූහිකය, "ස්ත්‍රීවාදී නායකත්වයේ වසර 40: සාමූහික ක්‍රියාකාරිත්වය, සටන්කාමීත්වය සහ ප්‍රත්‍යාස්ථිතිය" යන තේමාව යටතේ එහි 40 වන සංවත්සරය සැමරීය.

"ශ්‍රමය, කාන්තාවන් සහ අන්තර්ඡේදනය පිළිබඳ කාන්තා දේශපාලන ආර්ථිකය" යන මැයෙන් පැවති සාකච්ඡාවේ දී ධාබිඳු සාමූහිකයේ චමිලා තුෂාරි ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ කාන්තාවන් මුහුණ දෙන රැකියා අනාරක්ෂිතභාවය පිළිබඳව කතා කළාය. වත්මන් ආර්ථික අර්බුදය තුළ, "ප්‍රධාන පෙළේ කම්හල් ලෙස සලකන NEXT වැනි ආයතනත් නොකියාම වැසෙන අවස්ථාවක" දහස් ගණනක් රැකියා විරහිත විය හැකි බවත් ඇය අවධාරණය කළේ ඒ වෙනුවෙන් ස්ත්‍රීවාදී ව්‍යාපාරය කඩිනම් පියවර ගත යුතු බව පවසමිනි. වඩ වඩාත් අස්ථාවර ගෝලීය ආර්ථික පරිසරයක් තුළ කම්කරුවන්ගේ අයිතිවාසිකම් සහ ජීවනෝපායන් ආරක්ෂා කිරීමේ හදිසි අවශ්‍යතාවය ඇය අවධාරණය කළාය.

# ලිංගික හා සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සංසදයේ ඩාබිඳු



ජූනි 27 වැනිදා කිලිනොච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති ලිංගික හා සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සඳහා වූ සංසදයේ දී ශ්‍රීකාන්ති අයිංගරන් ඩාබිඳු සාමූහිකය නියෝජනය කළාය. ඩාබිඳු සමඟ සමීපව කටයුතු කරන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ නීති ආධාර කොමිසමේ නිලධාරීන් ඇතුළු දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය බලධාරීන් මෙම සංසදයට සහභාගී වූහ.

ශ්‍රීකාන්ති අයිංගරන් ඇඟළුම් සේවිකාවන්ගේ දරුවන් මුහුණ දෙන ගැටළු, විශේෂයෙන් දෙමාපියන්ගේ අධීක්ෂණය නොමැතිකම හේතුවෙන් දරුවන්ගේ අඩු සාක්ෂරතා මට්ටම් ඉස්මතු කළේය. බොහෝ වැඩ කරන මව්වරුන් වැඩමුර සඳහා උදෑසනම පිටත්වීම සහ දරුවන් තම පවුලේ වැඩිහිටියන් සමඟ සිටීම නිසා දෙමාපියන්ට දරුවන්ගේ පාසල් පැමිණීම සහ වැඩ කටයුතු නිසි ආකාරව අධීක්ෂණය කිරීමට නොහැකි වීම යන ගැටලුව කාන්තා සංවිධාන කිහිපයක් නැවත නැවතත් මතු කර තිබේ. මව්වරුන්ට තම දරුවන් පාසලට රැගෙන යාමට ඉඩ දීම සඳහා කර්මාන්තශාලා ආරම්භ කරන වේලාවන් උදේ 8.00 ලෙස වෙනස් කිරීම සලකා බැලීමට ඉල්ලීමක් කරන ලදී.

කර්මාන්තශාලා තුළ අධික උෂ්ණත්වය ආශ්‍රිත ගැටළු ද ඇය මතු කළ අතර, තනි සේවකයෙකුගේ පැමිණිල්ලක් පවා කඩිනම් පියවර ගැනීමට ප්‍රමාණවත් විය යුතු බව ද ඇය සඳහන් කළාය. මෙම සංසදයේදී මතු කරන ලද අනෙකුත් ගැටළු වූයේ දරුවන්ට උප්පැන්න සහතික නොමැතිකම සහ කාන්තා සේවිකාවන් නොමැති විට නිවසේ සිටින දරුවන්ට වන අපයෝජනයන්. සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ රාජ්‍යය ආධාරක පහසුකම් සහ සේවාවන් පිළිබඳ සේවකයින්ගේ හඬ නැංවීමට සහතික කිරීම සඳහා ඩාබිඳු මෙම සංසදවලට දිගටම සහභාගී වනු ඇත.



# පවුල් සැලසුම් කිරීම සහ උපත් පාලන ක්‍රම භාවිතා කිරීම ඔබේ අයිතියක් ද?

## ඒ කියන්නේ මොකක්ද... ?

- අනවශ්‍ය ගැබ් ගැනීම් වළක්වා ගැනීමේ ක්‍රම වලට
- එහෙමත් නැත්නම් කාන්තාවන්ට දරුවන් ලැබීමට කාලය සැලසුම් කිරීමට උපකාරී වන ක්‍රම.
- ඇයි කාන්තාවන්ට විතරක් ?... නෑ කාන්තාවම විතරක් නෙමෙයි. පවුලක සැමියා සහ බිරිඳ යන දෙන්නම විසින් මේ ක්‍රම භාවිතා කළ යුතුය.
- එතකොට තමයි, පවුලේ සෞඛ්‍යය සහ යහපැවැත්ම වැඩි දියුණු කරන්න මේවායින් පුළුවන් වෙන්නේ.

### උපත් පාලන ක්‍රම ගැන තියෙන මිත්‍යා මත

- උපත් පාලන ක්‍රම වඳභාවයට හේතු වේ.
- කාන්තාවන් පමණක් එය භාවිතා කළ යුතුය.
- එය විවාහක කාන්තාවන් සඳහා පමණි.

## මෙවැනි මිත්‍යා මත ඔබත් විශ්වාස කර ක්‍රියාත්මක කරන අයෙක්ද ?

### උපත් පාලන ක්‍රම වැදගත් වන්නේ ඇයි?

1. මව්වරුන් සහ ළදරුවන් නිරෝගීව තබා ගනී.

- පවුලක් ගැබ් ගැනීම් සැලසුම් කරන විට, කාන්තාවගේ ශරීරයට දරු ප්‍රසූති අතර විවේක ගැනීමට කාලය ලැබේ.
- මෙය මව සහ දරුවා යන දෙදෙනාගේම සෞඛ්‍ය අවදානම් අඩු කරයි.
- දරුවන් අතර අඩුම අවුරුදු දෙකක වත් කාල පරතරයක් පවතින විට වැඩි සැලකිල්ලක්, අවධානයක් සහ නිසි පෝෂණයක් ද දරුවාට ලැබේ.

2. ආතතිය සහ මූල්‍යමය බර අඩු කරයි.

- සැලසුම් නොකළ ගැබ්ගැනීම් මානසික වශයෙන් හා මූල්‍යමය වශයෙන් පීඩනයක්/ආතතියක් ඇති කළ හැකිය.
- අඩු හෝ හොඳින් සැලසුම් කළ දරුවන් සමඟ, පවුල්වලට වියදම් වඩා හොඳින් කළමනාකරණය කළ හැකි අතර, දෙමාපියන්ට අඩු ආතතියක් දැනේ.

3. කාන්තාවන්ට ඔවුන්ගේ ජීවිත කෙරෙහි වැඩි පාලනයක් ලබා දෙයි.

- කාන්තාවන්ට දරුවන් ලැබීමට අවශ්‍ය කවදාද නැද්ද යන්න තීරණය කළ හැකි විට, ඔවුන්ට ඔවුන්ගේ සෞඛ්‍යය, රැකියාව සහ ඉලක්ක කෙරෙහි අවධානය යොමු කළ හැකිය.
- එය ඔවුන්ගේ අනාගතය සඳහා තේරීම් කිරීමට නිදහස ලබා දෙයි.

ඔබගේ ජීවිතයේ තීරණ ඔබේ අතේ තිබිය යුතුය. දරුවන් සඳහා සුදුසු කාලය තෝරාගන්න, මවට සහ දරුවාට සෞඛ්‍යවත් ජීවිතයක් ලබාගන්න. ආර්ථික වශයෙන් ස්ථිර සෞඛ්‍යවත් ජීවිතයක් කරා එවිට යා හැක.

**මතක තබා ගන්න, පවුල් සැලසුම් කිරීම සහ එම ක්‍රම භාවිතා කිරීම ඔබේ අයිතියක්!**

නදුනි අයේෂිකා

# සිතුවිල්ල

ඒයි සුමී ආරංචිද කතාව...කියාගෙන කුසුම් කාමරයට රිංගුවා. අපේ එකියක් වෙළ මැද මරා දමලලු. දන්නවද සීන් එක. ඒකි Next එකේ වැඩ කරලා තියෙන්නේ. ඒකෙ වන්දිය හම්බුනානේ... ඉතිං ඉතිං... සුමියට ඉස්පාසුවක් නැතුව ඇස්ගෙඩි දෙකත් එළියට දාගෙන ඇඳේ වාඩි වුනා. ඒ විතරක් යැ බං තවත් අපේ එකියක් හාට් ඇටැක් එකක් හැදිලත් මැරුනලු. දෙකම ආයතනයෙන් ලබාදීපු වන්දි නිසා කියලයි ආරංචිය.

ඉදපංකෝ ඩිංගක් මගේ විස්තරේ කියනකම්. උබත් කැරලෙක් වගේ හැම එකටම හොට දානවා. මේකයි කාරණේ නෙක්ස්ට් කාරයා ළමයින්ට පොල්ල තියලා ආයතන හොර රහසේ වැහුවනේ. බලපං උන් වන්දි වැටුප් වැඩියෙන් දෙනවා කියලා සේවකයින් අන්දලා ආයතනය වහන්න හැදුවේ. ආන්න වන්දි ගන්න ගිය දවසේ ස්වෙච්ජාවෙන් ඉවත් වෙනවා කියලා ලියුම් වලට අත්සනකුත් අරන්ලු. මුං නම් මාර පාලකයෝ බං. මට දුක එයාලට එහෙම වෙද්දි අපිට මොනා වෙයිද කියලා. ඉතිං අර සුමිත්‍රා කොහොමින් හරි වන්දිය ගත්තා කියමුකෝ. ඒකට ඒකිගේ මිනිහා ඇහැ ගහන් ඉදලා වන්දිය උදුර ගන්න රණ්ඩු වෙලා අවසානයේ ඒකි මලා. අනේ හපොයි..මෙහෙමත් විනාශ... ආයතනයක් වැහුවා... රස්සාවලුත් නෑ... මරණයටත් පත්වුනා... අනේ හපෝයි... පව් බං නෙලුම් අඩ අඩා ඒකිගේ අඩුම කුඩුම ටික පටෝගෙන ආන් ගමට ගියාලු. අපිටත් ඔයම සන්තෑසිය තමයි බං වෙන්නේ. කොහේ හරි සමිතියකට බැඳිලා අපිත් ආරක්ෂා වෙන්න බලමු. පිස්සුද බං ඒ ආයතනයෙත් සමිතියක් තිබිලා තියෙනවා. මහ එවුන් ඒක සතේකට මායිම් කරලා නැහැ කියනවනේ. එහෙම කියලා හරි යන්නේ නැහැ. අපිට වෙන විසඳුමක් නෑනේ. මෙහෙම ආයතන වහගෙන වහගෙන ගියාම අපිට මොකද වෙන්නේ. එහෙන් ට්‍රම්ප් කාරයා අපිට බදු ගහනවලු. මොකද බං මේ හැම එකාම අපිට පහර ගහන්නේ. කොවිඩ් ආවත් අපි පලි, ආර්ථික අර්බුද ආවත් අපි පලි. දැන් බදු ගහනවා. අනේ බං අපි කියන කියන ගාන මහලා දෙද්දිත් මුං බලන්නේම අපිව නැති කරන්නනේ...

මේක හරියන්නේ නැහැ. මං අපේ ලයින් එකේ එවුන් එකතු කරලා සමිතියක් හදනවා. ඇයි බං අපිටත් බඩගිනි දැනෙනවා කියලා මුංට තේරෙන්නේ නැද්ද...

සමන්තා

# ප්‍රහේළිකා අංක - 52

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 ඉ | | 2 ප | | | 3 |
| | ■ | | ■ | ■ | |
| 4 දි | | | 5 ය | ■ | |
| | ■ | 6 | | | ■ |
| 7 | 8 | ■ | | ■ | 9 |
| ■ | 10 පු | | | | |

## හරහට

1. ආලෝකය ලබා ගැනීමට උදව් වේ.
4. ආසියානු රටක පිහිටි අගනුවරකි.
6. ඇළ.
7. යුගල පදයකට විෂ සමඟ එක්වන පදය.
10. දැනුම හා තොරතුරු ලබා ගැනීමට උපකාරී වේ.

## පහළට

1. ශ්‍රී ලංකාවට ආසන්නතම රට.
2. ආගමික ස්ථානයකි.
3. ලෝබ පුද්ගලයා මෙනමින්ද හඳුන්වයි.
5. හොඳ ගති පැවතුම් ඇති.
8. ගස් වර්ගයකි.
9. රුපියලට අඩු අගයකි.

මෙම ප්‍රහේළිකාව නිවැරදිව පුරවා පහත සඳහන් ලිපිනියට ඒවා මුදලින් වටිනා තෑගි දිනාගන්න.

ඩාබිඳු සාමුහිකය
221, වෙළබඩ පාර, කටුනායක.
දුරකථන අංකය: 077 725 9892

# වෙළඹ

හැන්දෑවෙ ගෙදර දුවලා...
රෙදි පෙරෙදි හෝද දමලා...
කුස්සියේ 'යුද්ධ' කරලා...
පැටවුනට කවා පොවලා...
කෑවයින් - නොකෑවයින්...
රෑ දෙගොඩහරිය මානේ...
'දුක් යහන' මත්තෙ දපලා...
හිමි සඳුගේ ගිණිත් නිවලා!...
අඩ නින්දෙ අඩක් ගෙවලා...
නැගිටලා හිරුට කලියෙන්...
ගෙයි 'උදේ මෙහෙය' නිමවා...
'හුණ්ඩුවක' නැමී හිරවී
වැඩ පොළට දුවමි පිම්මේ...
රතු ඉරට උඩින් පැනලා!...

බන්දුල ජයවීර



# ඇඟලුම් කම්කරුවන් උණුසුමෙන් උණුසුමට

ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵල යනු තව දුරටත් අනාගත තර්ජනයක් නොවන බව වර්තමානයේ දී අත් විඳින අර්බුධයක් වී හමාරය. දකුණු ආසියානු ඇඟළුම් කම්කරුවන්, විශේෂයෙන්ම කාන්තා සේවිකාවන් මේ වන විටත් මෙම අධික උෂ්ණත්ව ඉහළ යෑම හමුවේ පීඩා විඳිමින් සිටියි. කර්මාන්තශාලාවල විධිමත් වාතාශ්‍රය හුවමාරුවක් නොමැති වීම නිසා අධික උෂ්ණත්වය හමුවේ ඇතිවන ශරීර අපහසුතා පවා නොසලකා හරිමින් ඉතා දැඩි නිෂ්පාදන ඉලක්ක සපුරාලීමට කැප වී සිටීමට කම්කරු කාන්තාවන්ට සිදු වී ඇත.

සෞඛ්‍යාරක්ෂිත වැඩ පරිසරයක් නොමැති බොහෝ කම්හල්වල පානීය ජල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් ඇත්තේ ඉතා අවම මට්ටමකය. සේවිකාවන් ජලය පානයෙන් වැළකී තම ඉලක්කයන් සපුරා දීමට කැප වන්නේ විජලනය, මළ බද්ධය, මූත්‍ර ආසාදන, වකුගඩු ආශ්‍රිත රෝග හා මානසික නොසන්සුන්භාවය වැනි බොහෝ ගැටළු වලට අතවනමින්ය. එසේම මෙම උෂ්ණත්ව ඉහළ යාම කාන්තාවන්ට බහුලව බලපාන්නේ ඔසප් සමය, ගර්භණී සමය, ආර්ථවහරණ සමය ආදී අවස්ථා කලමනාකරණය කර ගැනීම තුළදී ඇතිවන අපහසුතා සමඟය.

අධික උෂ්ණත්වයෙන් ඇතිවන පීඩාකාරී තත්වය සමනය කරගත නොහැකි තැන සේවක කාර්යක්ෂමතාවය පහළ බසින අතර එහිදී නියමිත සැපයුම් ප්‍රමාණයට ලඟා වීමය නොහැකි වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය වෙළඳ සන්නාමයන්ට නව ප්‍රදේශ වෙත මාරු වීමට සිදුවීම නිසා කර්මාන්තශාලා වැසීම, සේවකයන්ට වැටුප් නොලැබීම වැනි තීරණාත්මක තත්ත්වයන් ඇතිවේ.

එපමණක් නොව, මෙම උෂ්ණත්ව ඉහළ යාම කර්මාන්තශාලාවෙන් ඔබ්බට ගොස් ඔවුන්ගේ නිවෙස් වලටද බලපානෙ සුළු වැටුප් ලබන කාන්තාවන්ගේ මූල්‍යමය තත්වයද පහළ දමමිනි. නිවෙස් වල විදුලි පංකා, වායු සමීකරණ යන්ත්‍ර වල අවශ්‍යතාවය මතු වෙද්දී එම අමතර වියදමද දැරීමට සිදු වන්නේ තමන්ට ලැබෙන සුළු වැටුපෙන් වීම අභියෝගාත්මකය.

මෙහිදී, බිලියන ගණන් ලාභ ලබන වෙළඳනාම, කර්මාන්තශාලා හිමියන් හා රජය ඒකාබද්ධව කටයුතු කළ යුත්තේ සුබෝපභෝගී ජීවිත නොඉල්ලන මෙම සේවකයන්ට පිරිසිදු ජල පහසුකම්, විධිමත් වාතාශ්‍රය, පෝෂණීය ආහාර, කාර්යක්ෂම විදුලි පංකා වැනි සෞඛ්‍යාරක්ෂිතව වැඩ කළ හැකි මූලික පහසුකම් ලබා දීමටය. කාලගුණ අර්බුද හමුවේ සේවකයන්ගේ ආරක්ෂාව සහ ගෞරවය රැක ගැනීම වගකීමකි. තවත් කල් දැමිය නොහැක.

මූලාශ්‍රය - https://www.facebook.com/share/p/19C5cUjXYG/



# ළමා කාලය අයිතියක්, වරප්‍රසාදයක් නොවේ

ළමා කාලය යනු ජීවිතයේ වටිනාම සහ අසීමිත හැකියාවන්ගෙන් යුත්, ජීවිතයේ මුල් පාඩම් ඉගෙනීම සිදු කරන සුන්දර වියකි. පුද්ගල ජීවිතයේ මුල්ම අඩිතාලම ගොඩ නැගෙන්නේ මෙකී කාලය තුළිනි. ඒ සොඳුරු ළමා විය විඳීම දරුවකුගේ මූලික අයිතියකි.

එහෙත් සෑම දරුවකුගේම ළමා කාලය සඳහා ඇති අයිතිය සදහා වන යුද්ධය තවමත් අවසන් වී නැත. වත්මනය වන විටත් ILO හා UNICEF විසින් 2021 දී නිකුත් කළ වාර්තාව අනුව ලෝකය පුරා දරුවන් මිලියන 160ක් පමණ ශ්‍රමයට යොදවනු ලබයි. මෙමගින් වයස 5-11 අතර දරුවන් 50%ක් පමණ වන අතර වඩාත් ආරක්ෂාවෙන් තොර ක්ෂේත්‍රවල මෙය දැක ගත හැක. මෙම තත්ත්වය නිසාවෙන් ජූනි 12 වැනි දිනය ලෝක ළමුන්ගේ ශ්‍රම විරෝධී දිනය ලෙස සැමරේ. මෙය ලෝකයේ විවිධ ප්‍රදේශවල දරුවන් ශ්‍රමයට යොදවීමෙහි පවතින ගැටළු පිළිබඳ අවධානය යොමු කරන අතර, දරුවන්ගේ අයිතිවාසිකම් හා සුරක්ෂිතභාවය පිළිබඳව සමාජය සවිමත් කරවනු ලබයි.

අපගේ රටේද, විශේෂයෙන්ම ආර්ථික අපහසුතා සහ සමාජමය තත්වයන් මත, බොහෝ දරුවන් කුඩා වයසේ සිටම ජීවනෝපාය සඳහා ශ්‍රමයට යොදවෙයි. කර්මාන්තශාලා, වාණිජ ව්‍යාපාර, ගෘහසේවා වෘත්තීය, ධීවර කර්මාන්තය වැනි ක්ෂේස්ත්‍රයන් තුළ මෙම තත්ත්වයන් දැකිය හැක. මේ සඳහා වගකිව යුත්තේ පවුල, සමාජය සහ පාලන අංශ මෙන්ම, නීති ක්‍රමයද වේ.

එවැනි දරුවන්ට අධ්‍යාපනය අවසන් කිරීමට නොහැකි වීම, ළමා හිංසනයට භාවිත වීම සහ වයසට නොගැලපෙන වගකීම් සහ බරපතළ වැඩ පැවරීම වැනි බලපෑම් සිදුවෙයි. මේ තත්ත්වය ඔවුන්ගේ ආරක්ෂාව, සමාජමය වර්ධනය සහ අනාගත ජීවිත ගුණාත්මකභාවය සඳහා දැඩි බාධාවක් වේ.

ළමා ශ්‍රම දිනය සනිටුහන් කරන මේ මොහොතේ, අපි අනුකම්පාවෙන් ඔබ්බට යමින් ප්‍රතිස්ථාපනය වන සහ සූරාකෑමෙන් අනාගතය අනතුරේ හෙළන සෑම දරුවෙකු සමඟම අපි සහයෝගයෙන් නැගී සිටිමු.

**ළමා ශ්‍රමයෙන් තොර ලෝකයක් කළ හැකිය - එය යථාර්ථයක් බවට පත් කරමු.**

රශ්මි වීරක්කුට්ටි

අංකඃ 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.